# ප්‍රභා වීරයෙක්ද??

මගේ හිතාදර මිතුරා ඉතා කනස්සළු ස්වභාවයෙන් පසුවන්නේ මන්දැයි ඔහුගෙන් නොවිමසාම තේරුම් ගන්නට මට හැකි ය. ජීවිතයේ සැප දුක්, කම්කටොලු හා සිත් තැවුල් එකිනෙකාට සැඟ වූ අවස්ථා අප අතරේ තිබෙන්නට ඇතැ යි මම නොසිතමි.

අවුරුදු 34ක් තරම් අතීතයකට දිව යන අප මිතුදමේ ආරම්භය 70 දශකයේ මැද භාගයයි. එවකට එකම ආයතනයක සිප් සතර හැදෑරූ අපි 19 වියේ පසු වූ තරුණයෝ වීමු. අද අප දෙදෙනාටම ඒ වයසේ දූ දරුවන් සිටී. ජීවිතයේ දී එදිනෙදා මුහුණ පාන බොහෝ දෑ ගැන අපි කතා කරන්නේ ඉතා විවෘත මනසින් වීම අපේ දීර්ඝ මිතුරුදමේ රහස විය හැකි යැයි බොහෝ අවස්ථා වල මට සිතී ඇත.

වරෙක අපි වාදයක පැටලෙමු. තවත් වරෙක තර්කානුකූලව කරුණු ඉදිරිපත් කරන මගේ මිතුරාගෙ මතයට මම එකඟ වෙමි. තවත් වරෙක ඔහු මා සමඟ එකඟ වෙයි. සමහර අවස්ථා වල එකඟතාවකට නොපැමිණ ම, ඔය කතාව දැන් ඔතැනින් නවත්තලා දාමු යැයි කියූ අවස්ථා ද නැතුවා නොවේ. කෙසේ වෙතත් එකිනෙකාගේ අදහස් වලට නිගරු කිරීමක් හෝ අපහාස කිරීමක් නොවූ බව නම් මම විශ්වාස කරමි.

කෙසේ වෙතත් මගේ මිතුරා අද මා සමඟ හුවමාරු කරගත්තේ එකම වචනයක් (මෝනිං - එදරබසබටගග) පමණි. එතැන් පටන් මේ දක්වා ම අහස පොළොව ගැටලන්නට මෙන් ඉවත බලා ගෙන කල්පනා කරමින් සිටියි. ඔහුගෙන් වෙනදා මෙන් ..මොකද, උඹට ප්‍රශ්නයක්වත් දැයි .. නො අසන්නට මම ප්‍රවේසම් වූයෙමි. කොයි මොහොතේ හෝ ඔහු කටහඬ අවදි කරන බව සක් සුදක් සේ මම දනිමි.

..මොකද උඹ හිතන්නේ.., ජීවිතේ අන්තිම මොහොත දක්වා ම ප්‍රභා ඔහුගේ පවුලේ උදවියත් සමඟ සටනට වැදුණා. මම හිතන්නේ ඔහු වීරයෙක්..

..ඒකද උඹ උදේ ඉඳන් මූණත් බෙරි කරගෙන කල්පනා කෙරුවෙ. නෑ, කොහෙත්ම නෑ.. ප්‍රභා වීරයෙක් නෙමෙයි. වීරයො කියන්නෙ මිනිසුන් ජීවත් කරන උදවියට. කල්ප ගණනාවම ඉඳලා පැවත එන මේ ලෝකයේ කෙනෙකුට මනුෂ්‍ය ආත්මයක් ලැබෙන්නේ බොහොම කෙටිකාලයකට. මොනම හේතුවක් නිසාවත් ඒ අයගෙ ජීවිත අකාලයේ බිලිග න්න හෝ බිලි දෙන්න කටයුතු කරන කෙනෙක් කොහොමද වීරයෙක් වෙන්නේ..??

...එහෙම නම් මහින්ද රාජපක්ෂ වීරයෙක් ද??

.. අද ශ්‍රී ලංකාවේ ජනප්‍රියම පුද්ගලයා ඔහුයි. ඒ විතරක් ද අද ඔහුට ජනාධිපතිකමේ සිට රජකම දක්වා උසස් වීමකුත් ලබා දීලා. ඒත් මම කියන්නෙ නෑ ඔහු වීරයෙක් කියලා. මේ යුද්ධය අවසන් වෙන කොට විශාල ජීවිත ප්‍රමාණයක් විනාශ වෙලා, මහ පොළොව සිපගත්තෙ ඉතාම කෙටි කාලයක් තුළයි. බිලියන ගණනින් දේපොළ විනාශ වෙලාව ආර්ථිකය සුන්නත්දූලි වෙලා. මහින්දට තිබුණා නම්, මොකක් හෝ වැඩපිළිවෙළක්, මේ ජීවිතත් බේරගෙන, ආර්ථික විනාශයත් බේරගෙන යම් දෙයක් කරන්න, මම ඔහුට වීරයෙක් කියනවා.

.. ඇති, ඇති.. උඹ ඔය එන්න හදන්නෙ රනිල්ට නෙ..?

කොහෙත්ම නෑ විමලෙ. (විමලේශ්වරන්) අපි මීට පෙරත් මේ ගැන කතා කරලා තියෙනවා. සමහර විට රනිල් ළඟ හොඳ වැඩපිළිවෙළක් තියෙන්න ඇති. ඒත් න්‍යායික දේශපාලනයෙන් වැඩක් නෑ. විශේෂයෙන් අපි වගේ දකුණු ආසියාවේ රට වලට. අපියි, උඹලයි දෙගොල්ලොම ශ්‍රී ලාංකිකයො කියලා හිතන්න පුරුදු වෙච්ච කාලෙකට එයාගෙ දේශපාලනය හොඳයි අපේ රටට. එතෙක් ප්‍රායෝගික නෑ. කොටින්ම අදප් රටේ බලයට එන්න අවශ්‍ය වෙන මූලික සිද්ධාන්තයවත් එයා ඉගෙන ගෙන නෑ.. බණ්ඩාරනායක මහත්තයා බලයට ආවේ කොහොමද? ඇයි චන්ද්‍රිකා..? එයාගෙ (රනිල්ගෙ) ආණ්ඩුව විසුරුවා හැරියෙ. 83 කලු ජූලියෙ ජේ.ආර්. ගෙ අමන හැසිරීමට හේතුව මොකක්ද? ඇයි ජේවීපී එක මාකස්වාදී පක්ෂයක් ලෙස පෙනී සිටිමින් ජාතිවාදී අදහස් දරන්නේ.? ඒ කිසිම දෙයක් රනිල් අධ්‍යයනය කරලා නෑ කියලා මම මීට කලිනුත් උඹට පැහැදිලි කරලා දුන්නා උඹට මතක ද? කොටින්ම අපේ රටේ බහුතර ජනතාව සිංහලයෝ හිතන පතන විදිහ තේරුම් නොගෙන බලය ලබා ගන්නෙ කොහොමද?

..උඹ කියන්නේ ජාතිවාදී මුහුණුවරක් නොපෙන්වා බලයට එන්න බෑ කියලනෙ.

..ඔව් ඒක උතුරටත්, දකුණටත් තාමත් පොදු සිද්ධාන්තයක්. බලය ලබා ගත්තයින් පස්සෙ තමයි ජනතාව තුළ චින්තන විප්ලව කිරීමට අවකාශයක් ලැබෙන්නෙ. එහෙම නැත්නම් මහින්දට කිං (..ණසබට * කියන කොට රනිල්ට නොදකිං :හද්‍ානසබට* කියන එක ගැන පුදුම විය යුතු නෑ..

.

හරි දූන් ඒ කතාව පැත්තකට දාපන්කො.. මෙච්චර යුද්දයක් වෙලත් වීරයො නෑ කියලනෙ උඹ කියන්නෙ..

මෙහෙමයි විමලෙ .. මේ යුද්දෙදි තනි තනිවම එක් එක්කෙනා වීරයන් හැටියට හැඳින්වීම විහිලුවක්. ජනාදිපතිතුමාවත් යුද හමුදාපති කියන විදිහට එයාවත් නැත්නම් ගෝඨාභය මහත්තයවත් නැත්නම් ගුවන් හරි නාවුක හමුදාපතිවරුන්වත් මේ යුද්ධයේ වීරයන් කීම සැබෑ වීරයන්ට කරන අගෞරවයක්... මේ එක් අයෙකුවත් කුරිරු සටන් බිමේ ජීවිත පරිත්‍යාග යෙන් සටන් වැදුණු අය නෙවෙයි.. මේ අය යුද්දය මෙහෙයවන්න ඇති.. මහජනතාවගේ ණය බර තවත් වැඩි කරමින් යුද්දයට වියදම් කරන්නත් ඇති. ඒත් සටන් බිමේ සටන් වැදුණු දුප්පත් අම්මල තාත්තාලා ගේ දූ දරුවන් තමයි ඕනෑම සටනක වීරයන් වෙන්නෙ.. එයින් කී දාහකට හෙට දවසේ ජීවත් වීමේ අයිතිය නැති වෙන්න ඇද්ද..? නොමග ගිය සටන් වැදුණු තරුණයන් ගැනත් මට තියෙන්නෙ එවැනිම හැඟීමක්.. උඹලගෙ දුප්පත් අම්මල තාත්තලගෙ දරුවො නොමග ගිහිල්ලා එහෙමත් නැත්නම් පැහැරගෙන ගිහිල්ලා ඔවුන්ගේ ජීවිත අයිතිය අහිමි කර පොළොවට පස් කිරීම වීරයෙකු අතින් සිදුවන ක්‍රියාවක් ද? මරාගෙන මැරෙන බෝම්බ කරුවන් බිහිකළේ ප්‍රභා.. එය කොයි තරම් ම්ලේච්ඡ මිනිස් සංහාරයක් ද?

උඹ කොයි තරම් කතා කළත් ප්‍රභාල වගේ අය බිහිවුණේ මොකද කියන එක ගැන නොකියන්න ප්‍රවේශස් වෙනවා. අර බඩගෝස්තරවාදෙට ලස්සන වචන ගලපන විරවංශ වගේ නමසිය හතළිස් ගණන් වල අපි නිදහස ගන්න සටන් කරනකොට අපි දෙගෙ ාල්ලොම එකට වෙලන ශක්තිමත් ගහක් විදිහටයි ඉඳලා තියෙන්නෙ.. ඒකන්තරම අපේ තාත්ත කියපු දෙයක්.. උඹලගේ බලලෝභී දේශපාලකයොයි අන්තවාදී සිංහල ආකල්ප දරන මිනිස්සුයි මේ විනාශයේ කොටස් කරුවෝ.. කොටි බිහිකෙරුවෙ ඒ අය නෙවෙයි කියලද උඹ කියන්නෙ..? ඒ බිහිකරපු කොටියට ඉන්දියාව ඇතුළු අනෙකුත් ජාත්‍යන්තර බලවේග කිරි පොවමින් ඔවුන්ගේ කලාපීය අවශ්‍යතා සඳහා ඇති දැඩි කෙරුවා.. 83 දී ජේ ආර් මේ කොටියව ලොව වටා ව්‍යාප්ත කරලා වෙළඳ නාමයක් අරන් දුන්නා..

ඇති ඇති විමලේ.. 18 වෙනිදා පාන්දරම අපි ඇද ගත්තෙ මහ දිග කතාවක්.. උඹ කියපු දේවල් වලට මම එකඟයි.. ඒත් ඔය බොහොමයක් දේ තේරුම් ගත්ත අය අතළොස්සක් වීම අපි දෙගොල්ලන්ගේම අවාසනාව.. දැනට මේ කතාව මෙතනින් නවත්තලා පසුව කතා කරමු.. ඊට කළින් උඹ මේ යුද්ධයේ වීරයො ගැන අහපු නිසා මම කෙටි පිළිතුරක් දෙන්නම්.. ගිය දේ ගියා කියල අමතක කරල අවශ්‍ය නම් මේ යුද්දයේ සැබෑ වීරයෙක් වීමට හැකියාව තියෙන එකම එක පුද්ගලයෙක් ඉන්නවා.. ඒ මහින්ද රාජපක්ෂයි.. ඒ සඳහා ඔහු උතුරක් දකුණක් යා කළ යුතුයි. ඒ යාල්දේවි කෝච්චියෙන් හෝ ඒ9 මාර්ග යෙන් හෝ නෙවෙයි.. හදවත් වලින්.. හරියට උඹයි මමයි වගේ.. මතකද අපේ තරුණ කාලේ තල් ගස් යට අපි විඳපු සුන්දර ජීවිතය.. අන්න එවැනි යුගයකට නැවත අප ගෙන යාම ට කැපවී කටයුතු කළොත් සියලු දේ අමතක කර මහින්ද මේ යුද්ධයේ සැබෑ වීරයා ලෙස පිළිගන්න උඹටත් මටත් හැකි වන බව මගේ අදහසයි..

නැවුම් සිත්‍යාකරගේ

Immigration...
We do not just provide Services
We provide Solutions



Don Susantha Katugampala
LL.B (Monash)
Barrister & Solicitor
Accredited Immigration Law Specialist
by Law Institute of Victoria
MARN: 9686306

Melbourne:
10, Morrison Place
East Melbourne
Victoria 3002 AUSTRALIA
Tel: 61 3 9650 4557
Interstate Callers: 1300 888 331
Mob: 61 417 851 041

Colombo:
No 1 Ground Floor
Hilton Colombo Residence
(JAIC Hilton Towers)
200 Union Place
Colombo 02 SRI LANKA
Tel: 011 230 06 27
Mob: 94 777 347 670

Dubai:
No 6, Juma Aman Building
Al Nadha Dubai UAE
Tel: 97 142984588
Mob: 97 1506580841

Email: fairfields.lawyers@bigpond.com

GUSS DESIGN

FAIRFIELDS
IMMIGRATION LAWYERS - MELBOURNE
LAW INSTITUTE OF VICTORIA SPECIALIST ACCREDITATION

We Deliver Results.....